# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

# පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන)

**(262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

කොළඹ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු නීතිඥ ප්‍රේමනාත් සී. දොලවත්ත මහතා විසින්
2022 නොවැම්බර් මස 08 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2022 ඔක්තෝබර් මස 14 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

[160 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

මිල : රු. 15.00 තැපැල් ගාස්තුව : රු. 15.00

මෙම පනත් කෙටුම්පත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන)

### (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත 2022 අංක දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය

**2.** 2017 අංක 16 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනතේ 8 වන වගන්තිය මඟින් සංශෝධනය කරන ලද ප්‍රධාන ප්‍රඥප්තියේ 28 වන වගන්තිය පහත පරිදි සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 28 වන වගන්තිය සංශෝධනය කිරීම

(i) ඉහත සඳහන් 2017 අංක 16 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනතේ 8 වන වගන්තියේ (2) වන උපවගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 28 වන වගන්තියේ (2) වන උපවගන්තිය වෙත ඉදිරිපත් කරන ලද සංශෝධනය පූර්ණ වශයෙන් ඉවත් කර පහත වගන්තිය ආදේශ කිරීමෙන් සංශෝධනය කරනු ලැබේ:—

"එම වගන්තියේ (2) වන උපවගන්තියේ, (මෙහි මින්මතු "ස්වාධීන කණ්ඩායම" ලෙස හඳුන්වනු ලබන) යම් පිළිගත් දේශපාලන පක්ෂයක්" යන වචනවල සිට "ආකෘතියට සාරානුකූල වූ ආකෘතියකින්" යන වචන දක්වා ඇති වචන වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:—

"(2) යම් පළාත් පාලන ආයතනයක සියලු කොට්ඨාස සම්බන්ධයෙන් යම් පිළිගත් දේශපාලන පක්ෂයක් හෝ ස්වාධීන කණ්ඩායමක් විසින් නාමයෝජනා පත්‍ර දෙකක් ඉදිරිපත් කළ යුතු ය. එම නාමයෝජනා පත්‍රවල, පළමු නාමයෝජනා පත්‍රයේ සඳහන්, තෝරා පත්කර ගත යුතු සම්පූර්ණ සභික සංඛ්‍යාවෙන් සියයට දහයකට නොඅඩු සංඛ්‍යාවක් සහ දෙවන නාමයෝජනා පත්‍රයේ

සඳහන්, තෝරා යැවිය යුතු අපේක්ෂකයන්ගේ සංඛ්‍යාවෙන් සියයට පනහකට නොඅඩු සංඛ්‍යාවක් කාන්තා අපේක්ෂිකාවන්ගෙන් සමන්විත විය යුතු ය. තව ද, පළමු නාමයෝජනා පත්‍රයේ සඳහන්, තෝරා පත්කර ගත යුතු සම්පූර්ණ සභික සංඛ්‍යාවෙන් සියයට දහයකට නොඅඩු සංඛ්‍යාවක් කාන්තා අපේක්ෂිකාවන් විය යුතු ය යන නියමය සුරැකෙන පරිදි එම ලැයිස්තුවේ සම්පූර්ණ අපේක්ෂක සංඛ්‍යාවෙන් සියයට විසිපහකට නොඅඩු සංඛ්‍යාවක් සහ දෙවන නාමයෝජනා පත්‍රයේ සඳහන්, තෝරා යැවිය යුතු අපේක්ෂකයන්ගේ සංඛ්‍යාවෙන් සියයට පනහකට නොඅඩු සංඛ්‍යාවක් කාන්තා අපේක්ෂිකාවන්ගෙන් සමන්විත විය යුතු ය යන නියමය සුරැකෙන පරිදි එම ලැයිස්තුවේ සම්පූර්ණ අපේක්ෂක සංඛ්‍යාවෙන් සියයට විසි පහකට නොඅඩු සංඛ්‍යාවක් තරුණ අපේක්ෂක අපේක්ෂිකවන්ගෙන් සමන්විත විය යුතු වන අතර, යම් පළාත් පාලන ආයතනයක සභිකයින් ලෙස තෝරාපත්කරගනු ලැබීමේ කාර්යය සඳහා මෙහි පළමුවන උපලේඛනයේ දක්වා අති ආකෘතියට සාරානුකූල වූ ආකෘතියකින්";

(ii) 2017 අංක 16 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනතේ 8 වන වගන්තියේ (6) වන උපවගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 28 වන වගන්තියේ (2අ) වන උපවගන්තියට හඳුන්වා දී තිබෙන සංශෝධනය පූර්ණ වශයෙන් ඉවත් කර පහත පරිදි සංශෝධනය කරනු ලැබේ:—

"(2අ) කොමසාරිස්වරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නිවේදනයක් මඟින්, (2) වන උපවගන්තියේ නිශ්චිතව සඳහන් පරිදි එක් එක් පළාත් පාලන බල ප්‍රදේශය සම්බන්ධයෙන් පළමු නාමයෝජනා පත්‍රයේ හා අතිරේක නාමයෝජනා පත්‍රයේ නම් කළ යුතු අවම කාන්තා අපේක්ෂිකාවන් සංඛ්‍යාව සහ තරුණ අපේක්ෂකයින් සංඛ්‍යාව නිශ්චිතව දැක්විය යුතු ය. නම් කිරීමට නියමිත කාන්තා අපේක්ෂිකාවන්ගේ සම්පූර්ණ ගණන පළමු

නාමයෝජනා පත්‍රයේ තෝරා ගැනීමට නියමිත සම්පූර්ණ ප්‍රමාණයෙන් සියයට දහයකට වඩා අඩු නොවිය යුතු අතර, නම් කිරීමට නියමිත තරුණ අපේක්ෂකයින්ගේ සංඛ්‍යාව පළමු නාමයෝජනා පත්‍රයේ තෝරා ගැනීමට නියමිත සම්පූර්ණ ප්‍රමාණයෙන් සියයට විසිපහකට වඩා අඩු නොවිය යුතු ය. එමෙන්ම අතිරේක නාමයෝජනා පත්‍රයේ සඳහන් තෝරා යැවිය යුතු අපේක්ෂකයින්ගේ ගණනින් කාන්තා අපේක්ෂිකාවන් සංඛ්‍යාව සියයට පනහකට වඩා අඩු නොවිය යුතු අතර තරුණ අපේක්ෂකයින්ගේ සංඛ්‍යාව සියයට විසිපහකට වඩා අඩු නොවිය යුතු ය. එම ප්‍රමාණය පූර්ණ සංඛ්‍යාවක් සහ භාග සංඛ්‍යාවක් වන විට මෙම පනතේ කාර්යය සඳහා නියමිත ගණන වශයෙන් පූර්ණ සංඛ්‍යාව සලකනු ලැබිය යුතු ය.";

(iii) ඉහත සඳහන් 2017 අංක 16 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනතේ 8 වන වගන්තියේ (8) වන උපවගන්තිය සහ (9) වන උපවගන්තිය මඟින් සංශෝධනය කරන ලද ප්‍රධාන ප්‍රඥප්තියේ 28 වන වගන්තියේ (2ඈ) සහ (2ඉ) උපවගන්ති මෙයින් ඉවත් කරනු ලැබේ.

(iv) 2017 අංක 16 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනතේ 11 වන වගන්තියේ (2) වන උපවගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 31 වන වගන්තියට ඇතුළත් කර ඇති (ඊ) ඡේදය පූර්ණ වශයෙන් ඉවත් කර පහත පරිදි සංශෝධනය කරනු ලැබේ:—

"(ඊ) මෙම ආඥාපනතේ 28 වන වගන්තියේ (2අ) උපවගන්තිය යටතේ නම් කිරීමට නියමිත සම්පූර්ණ කාන්තා අපේක්ෂිකාවන් ගණන හා තරුණ අපේක්ෂකයින් ගණන අන්තර්ගත නොවන්නා වූ, නාමයෝජනා පත්‍රය,".

සැක දුරුකිරීමේ වගන්තිය

3. (අ) මෙම පනතේ 2 (i) සහ 2 (ii) උපවගන්තිවලින් සඳහන් කරන පරිදි යම් පළාත් පාලන ආයතනයක පළමු නාමයෝජනා පත්‍රයේ සියයට දහයක කාන්තා අපේක්ෂකත්වය තහවුරු කිරීම සිදුකිරීමේ දී එම සියයට දහයක ප්‍රමාණය සියයට හැත්තෑ පහක වැඩිහිටි අපේක්ෂක ප්‍රමාණය සහ සියයට විසි පහක තරුණ අපේක්ෂක ප්‍රමාණය යන ද්විත්වය තුළ හැකිතාක් දුරට සම ප්‍රතිශතයක් බෙදී යන පරිදි සිදුකළ යුතු ය.

එමෙන් ම මෙම පනතේ 2 (i) සහ 2(ii) උපවගන්තිවලින් සඳහන් කරන පරිදි යම් පළාත් පාලන ආයතනයක දෙවන නාමයෝජනා පත්‍රයේ සියයට පනහක කාන්තා අපේක්ෂකත්වය තහවුරු කිරීම සිදු කිරීමේ දී එම සියයට පනහක ප්‍රමාණය සියයට විසි පහක තරුණ අපේක්ෂක ප්‍රමාණය සහ සියයට හැත්තෑ පහක වැඩිහිටි අපේක්ෂක ප්‍රමාණය යන ද්විත්වය තුළ හැකිතාක් දුරට බෙදී යන පරිදි සිදු කළ යුතු ය.

(ආ) මෙම පනතේ විධිවිධානවලට පටහැනිව වෙනත් යම් පනතක කුමක් සඳහන් වුව ද මෙම පනතේ විධිවිධාන ඊට එරෙහිව බලාත්මක වන්නේ ය.

අර්ථ නිරූපණය

**4.** (අ) මෙම පනතේ කුමන හෝ වගන්තියක සඳහන් වන "තරුණ අපේක්ෂකයින්" යන යෙදුම තරුණ අපේක්ෂක අපේක්ෂිකාවන් ලෙස කියවා තේරුම් ගත යුතු ය.

(ආ) මෙම පනත අනුව "තරුණ අපේක්ෂකයින් හා අපේක්ෂිකාවන්" යන්නෙන් වයස අවුරුදු 18 ත් 35 ත් අතර වයස් කාණ්ඩයේ පසුවන අය අදහස් වේ.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

**5.** මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.